## 3 ඒකකය

# ලෝකයේ පැරණි ශිෂ්ටාචාර

## 1 - පාඩම

- ශිෂ්ඨාචාරයක් යනුවෙන් හැඳින්වෙන්නේ නගර සහ ඒවායේ ජීවත්වන සැලකිය යුතු තරමේ විශාල ජනගහනයක් ජීවත්වන සමාජයකි.

### ශිෂ්ටාචාරයක ලක්ෂණ

- නාගරිකයන් ලෙස ශිෂ්ටාචාරික මිනිසුන් හැඳින්වීම.
- මිනිසුන් අකුරු ලිවීමට හුරුවීම.
- නගර පාලනයට පිරිසක් සිටීම.
- නගරවල ජීවත් වූ පිරිස ආගමික ස්ථාන ඉදිකිරීම.
- මිනිසුන් වෙනත් දුරු රටවල් සමග වෙළඳාමේ නිරත වීම.
- ගලින් තැනූ ගෙවල් දක්නට ලැබීම.
- හොඳින් ඉදිකළ මං මාවත් දක්නට ලැබීම.
- දිය අගල් හා ප්‍රාකාර දක්නට ලැබීම.

- ලෝකයේ නොයෙක් ප්‍රදේශවල ජීවත් වූ මිනිසුන් විවිධ කාලවල තමන්ගේම ශිෂ්ටාචාර තනාගෙන තිබේ. ඒ අතුරින් පැරණිතම ශිෂ්ටාචාරය ලෙස පහත ඒවා දැක්විය හැකිය.

1. මෙසපොතේමියානු ශිෂ්ටාචාරය.
2. ඊජිප්තු ශිෂ්ටාචාරය.
3. ඉන්දු නිම්න ශිෂ්ටාචාරය.
4. චීන ශිෂ්ටාචාරය.

### ක්‍රියාකාරකම -1

**ඉහත තොරතුරු හා පෙළ පොත උපයෝගී කර ගෙන පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

1. නගර හා එහි විසූ නාගරිකයන් ජීවත් වූ ආකාරය ............................ යනුවෙන් හැඳින්වේ.
2. පහත ලක්ෂණ වලින් ගමක හා නගරයක දක්නට ලැබෙන ලක්ෂණ වෙන් කොට දක්වන්න.
   - වරිච්චි ගෙවල් දක්නට ලැබීම.
   - නාගරිකයන් දක්නට ලැබීම.
   - සතුන් ඇති කිරීම දක්නට ලැබීම.
   - ගලින් තැනූ ගෙවල් දක්නට ලැබීම.

| ගම | නගරය |
|---|---|
| | |

3. ලෝකයේ පැරණිතම ශිෂ්ටාචාර දෙකක නම් ලියා දක්වන්න.
    1. ......................................................
    2. ......................................................

**2 - පාඩම**

## **මෙසොපොතේමියානු ශිෂ්ටාචාරය**

- මෙම ශිෂ්ටාචාරය දියුණු වූයේ යුප්‍රටීස් ටයිග්‍රීස් ගංගා නිම්නවල ය.
- මෙම ගංගා පිහිටි ප්‍රදේශය අද අයත් වන්නේ ඉරාකයටය.
- දෙගම්මැදි රාජ්‍යය ලෙස හැඳින්වූයේ ද මෙසොපොතේමියාවයි.
- " ගංගා දෙකක් මැදිවන සේ පිහිටි රට " යන්න මෙසොපොතේමියා යන වචනයෙන් අදහස් වේ.
- මෙම ශිෂ්ටාචාරය බිහිවූයේ ක්‍රිස්තු පූර්ව 3100 – 2900 අතර කාලයේදීය.
- වර්ෂාව , සුළඟ සහ ගංවතුර මෙසොපොතේමියානු වැසියෝ දේවත්වයෙන් ඇදවූහ.
- දේවාල හැඳින්වීමට " සිගුරට් " යන වචනය භාවිතා විය.
- දේව මණ්ඩලයේ ප්‍රධානියා වූයේ "අනු" නමින් හැඳින්වූ දෙවියා ය.
- " එන්කිකි" යන නමින් පොළොවට අධිපති දෙවියා හඳුන්වන ලදී.
- සුළඟට හා ගොවිතැනට අධිපති දෙවියා "එන්ලිලී" නම් විය.

**ක්‍රියාකාරකම - 2**

**පෙළ පොත හා ඉහත කරුණු උපයෝගී කරගෙන පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න. (හිස්තැන් පුරවන්න.)**

1. මෙසොපොතේමියානු ශිෂ්ටාචාරය දියුණු වූයේ ............................... සහ .......................... යන ගංගා නිම්න වලය.
2. ඉහත ගංගා නිම්න පිහිටා ඇති ප්‍රදේශය වතර්මානයේ අයත් වන්නේ ...............................ට ය.

3. මෙසොපොතේමියානු ශිෂ්ටාචාරය බිහි වූයේ ක්‍රි.පූ. ...................... අතර කාලයේදී ය.
4. පහත ඒවා කෙටියෙන් පහදන්න
    a. එන්කිකි
    b. එන්ලිලි
    c. සිගුරට්
5. මෙසොපොතේමියානු ශිෂ්ටාචාරයේ පිහිටීම ලෝක සිතියමක ලකුණු කොට නම් කරන්න.

**3 - පාඩම**

## මෙසොපොතේමියානු ශිෂ්ටාචාරයේ වෙළෙඳාම

- ගංගාවල යාත්‍රා කරන කුඩා නැව් වලින් වෙළෙඳාම් කළෝය.
- ඔවුහු කෑම බීම, ඇඳුම් පැළඳුම් මේ නැව් වල ගෙන ගියහ.
- මෙසොපොතේමියාවේ උතුරු කොටසේ සිටි ඇසිරියන්වරු දක්ෂ වෙළෙන්දෝ වූහ.
- වෙළෙඳ භාණ්ඩ බූරුවන් පිට මත පටවාගෙන වෙළෙඳාමේ ගියහ. මේවා තවලම් යනුවෙන් හැඳින්වේ.

## මෙසොපොතේමියානු ශිෂ්ටාචාරයේ සමාජය

සමාජය කොටස් 4කි.

1. පූජකයින්
2. ඉහල පන්තිවලට අයත් වැසියන්
3. පහල පන්තිවලට අයත් වැසියන්
4. වහලුන්

**ක්‍රියාකාරකම - 3**

ඉහත තොරතුරු හා පෙළ පොතෙහි 23, 24 පිටු උපයෝගී කරගෙන පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

1.



a. මෙම පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක්ද?
b. මෙසොපොතේමියානු ශිෂ්ටාචාරයේ වැසියන් මෙය කුමක් සඳහා භාවිතා කළේ ද?
c. මේවායින් රැගෙන ගිය භාණ්ඩ දෙකක් ලියන්න.

2. " තවලම " යන්න කෙටියෙන් හඳුන්වන්න.
3. මෙසොපොතේමියානු ජන සමාජයේ ප්‍රධාන කොටස් හතර ලියා දක්වන්න.
4. මෙසොපොතේමියානු ජන සමාජයේ සිටි බලවත්ම කොටස කවුරුන්ද?

<u>4 - පාඩම</u>

## <u>මෙසොපොතේමියානු ශිෂ්ටාචාරයේ අක්ෂර පද්ධතිය</u>

- ලෝකයේ පැරණිතම අක්ෂර පද්ධතිය හඳුන්වාදෙන ලද්දේ මෙම ශිෂ්ටාචාරයට අයත් වැසියන්ය.
- මෙම අක්ෂර ශුන්‍යා අක්ෂර ලෙස හැඳින්වේ.
- ශුන්‍යා අක්ෂර මැටි පුවරු මත ලියන ලදී.
- ප්‍රධාන වශයෙන් වෙළෙඳාම් කටයුතු වලට අදාල දෑ ලියන ලදී.
- මෙසොපොතේමියාවේ ගිල්ගමේෂ් නමැත්තා විසින් රචිත ලෝකයේ පැරණිතම සාහිත්‍ය කෘතිය ශුන්‍යා අක්ෂරයෙන් ලියන ලද්දකි.
- එසේ ම ලෝකයේ පැරණිතම නීතිපොත සකස් කළේ ද මෙසොපොතේමියාව පාලනය කළ හමුරාබි නම් පාලකයා විසිනි.

<u>ක්‍රියාකාරකම - 4</u>

**පෙළ පොත ( පිටු අංක 24) සහ ඉහත තොරතුරු උපයෝගී කරගෙන පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

1. ලෝකයේ පැරණිතම අක්ෂර පද්ධතිය හඳුන්වාදෙන ලද්දේ ....................................................... වැසියන් විසිනි.
2. එම අක්ෂර හැඳින්වෙන්නේ ............................................................. නමිනි.
3. අක්ෂර ලිවීමට භාවිතා කළේ මැටි වලින් සාදන ලද ....................................... වේ.
4. ලෝකයේ පැරණිතම සාහිත්‍ය කෘතිය ලියන ලද්දේ ....................................................... නමැත්තා විසිනි.
5. ලෝකයේ පැරණිතම නීතිපොත සකස් කරන ලද්දේ මෙසොපොතේමියාව පාලනය කළ ............................ පාලකයා විසිනි.

**<u>5 - පාඩම</u>**

## <u>ඉන්දු නිම්න ශිෂ්ටාචාරය</u>

- 1ඉන්දියාවේ වයඹ දිග ප්‍රදේශය හරහා ගලා යන ඉන්දු ගංගා නිම්නයේ මෙම ශිෂ්ටාචාරය දියුණු විය.




- වර්තමානයේ එම ප්‍රදේශය අයත් වන්නේ
    - ඉන්දියාවේ වයඹ දිග කොටසට
    - පකිස්තානයට හා
    - ඇෆ්ගනිස්ථානය යන රටවලටය.
- මෙම ශිෂ්ටාචාරයේ දියුණු ම අවස්තාව පැවතියේ ක්‍රිස්තු පූර්ව 2600 – 1990 අතර කාලයේය.
- ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ පැවති ප්‍රධානතම නගර දෙක මොහෙන්ජොදාරෝ සහ හරප්පා වේ.
- මෙහි විසූ ජනයා භාවිතා කළ ලෝහ වර්ග ප්‍රධාන වශයෙන් හතර වර්ගයකි.
    - තඹ
    - ලෝකඩ
    - ඊයම්
    - ටින්
- ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් ප්‍රධාන සැලසුම්ගත නගර 4ක් තිබී ඇත.
    1. මොහෙන්ජොදාරෝ
    2. හරප්පා
    3. ධොලවීර
    4. කාලිබන්ගන්

**<u>ක්‍රියාකාරකම - 5</u>**

**ඉහත සටහන සහ පෙළ පොත (  පිටුව 25) උපයෝගී කරගෙන අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

1. ලෝක ආකෘති සිතියමක් ගෙන ඉන්දු නිම්න ශිෂ්ටාචාරය දියුණු වූ ඉන්දු නිම්නය ළකුණු කොට නම් කරන්න.
2. වර්තමානයේ එම ප්‍රදේශයේ කොටස් අයත් වන රාජ්‍යයන් තුන ලියන්න.
3. එහි පැවතුන ප්‍රධාන සැලසුම් සහගත නගර 4 ලියන්න.
4. ඉහත නගර හතරින් ද ප්‍රධාන ම නගර දෙකක් තිබිණි. එම නගර දෙක නම් කරන්න.
5. ඉන්දු නිම්න වැසියන් භාවිතා කළ ලෝහ වර්ග හතර ලියා දක්වන්න.

**<u>6 - පාඩම</u>**

## <u>ඉන්දු නිම්න ශිෂ්ටාචාර අවධිය</u>



- මෙම මූර්තියෙන් පූජකයෙකු පිළිබිඹු කරයි.
- නළලේ දක්නට ඇති පටියෙන් පූජකතුමාගේ උසස් බව සංකේතවත් කරයි.
- ඇස් අඩවන් කර තිබීමෙන් සන්සුන්ව භාවනාවෙන්  සිටින බව පෙන්වයි.



- මෙම පින්තූරයෙන් ප්‍රවාහනය සඳහා යොදාගත් කරත්තයක් නිරූපනය කරයි.



- මෙය ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් මුද්‍රාවකි.
- රූපයේ ඇති සත්ත්වයා රයිනෝසිරස් වේ.

**<u>ක්‍රියාකාරකම - 6</u>**

**පෙළ පොත සහ ඉහත පින්තූර ඇතුලත් සටහන කියවා පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

1.



1. මෙම මූර්තියෙන් පිළිබිඹු වන්නේ කවුරුන් ද?
2. ඔහු උසස් පුද්ගලයෙක් යැයි හැඟවෙන්නේ කුමන සංකේතයක් නිසා ද?

2.



1. මෙම පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක්ද?
2. එය කිනම් කටයුත්තක් සඳහා ඉන්දු නිම්න වැසියන් භාවිතා කළේ ද?

3.



1. මෙහි දක්නට ලැබෙන්නේ කිනම් පින්තූරයක් ද?
2. රූපයේ දැක්වෙන සත්ත්වයා නම් කරන්න.

## 7 - පාඩම

## ඊජිප්තු ශිෂ්ටාචාරය




- නයිල් ගංගාවේ පහල කොටස අයත් නිම්න ප්‍රදේශයේ මෙම ශිෂ්ටාචාරය දියුණු විය.
- ඒ ක්‍රි.පූ. 3150 දී පමණ ය.
- එම ප්‍රදේශය වර්තමාන ඊජිප්තුවට අයත් වේ.
- දිගු කලක් පාරාවෝ රජ පෙළපත විසින් පාලනය කරන ලදී.

- ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මයයි.
- මෙහි වැසියන් ලෝකයට දායාද කළ විශිෂ්ටතම නිර්මාණය පිරමීඩ වේ.
- පාරාවෝ රජවරුන්ගේ මළ සිරුරු පිරමීඩවල තැන්පත් කරන ලදී.
- ඊජිප්තු චිත්‍රාක්ෂර තවත් වැදගත් අංගයකි.
- 



○ ඊජිප්තුවේ ගීසා නමැති ස්ථානයේ පිහිටි පිරමීඩය මෙයයි.

○ මෙය ලෝකයේ පුදුම හතෙන් එකකි

○ මේවායේ පාරාවෝ රජවරුන්ගේ සහ බිසෝවරුන්ගේ මෘත දේහ තැන්පත් කරන ලදී.

- ලෝකයේ පැරණිතම පිරමීඩ ඉදිකරන ලද්දේ ක්‍රිස්තු පූර්ව 2630 – 2611 අතර කාලයේදී ය.

<u>ක්‍රියාකාරකම - 7</u>

**ඉහත සටහන සහ පෙළ පොත 27, 28 පිටු උපයෝගී කරගෙන පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

1. ලෝක ආකෘති සිතියමක් ගෙන ඊජිප්තුව ලකුණු කොට නම් කරන්න.
2. ඊජිප්තු ශිෂ්ටාචාරය දියුණු වූයේ ක්‍රිස්තු පූර්ව .......................... දී පමණය.
3. ඊජිප්තු ශිෂ්ටාචාරය දීර්ඝ කාලයක් තිස්සේ පාලනය කළේ .................................... නමින් හැඳින්වෙන රජ පෙළපතක් විසිනි.
4. ඊජිප්තු ශිෂ්ටාචාරයේ මිනිසුන්ගේ ප්‍රධාන ජීවනෝපාය ........................................ යයි.
5. මෙහි වැසියන් ලෝකයට දායාද කළ විශිෂ්ටතම නිර්මානය .............................. වේ.
6. ............................... නමින් හැඳින්වෙන්නේ නොයෙකුත් සතුන්ගේ සහ භාණ්ඩවල රූප භාවිතා කොට නිර්මානය කළ අක්ෂර ය.

7.



I. මෙම රූපයේ දැක්වෙන්නේ කුමක්ද?

II. එය පිහිටා ඇත්තේ කොහේද?

III. මේවායේ තැන්පත්කර ඇත්තේ කාගේ මෘත දේහද?

**<u>8 - පාඩම</u>**

## <u>ඊජිප්තු ශිෂ්ටාචාර අවධිය -1</u>



- මෙම රූපයෙන් දැක්වෙන්නේ පාරාවෝ රජෙකු වූ අක්හෙනතන්ගේ බිසොවය. ඇගේ නම නෙෆනෙෆවුටෙන් නෙෆර්ටිටි ය.
- රජු මිය යාමෙන් පසු කෙටි කළක් මෙම රැජින විසින් ඊජිප්තුව පාලනය කරන ලදී



- මෙම සංකේතය නිපදවා ඇත්තේ ඊජිප්තු ශිෂ්ටාචාරයට අයත් උගතුන්ය.
- මෙම සංකේතය සකස් කර ඇත්තේ එදිනෙදා ජීවිතයට සම්බන්ධ නොයෙක් භාණ්ඩ සහ දකින ඇසුරු කරන දෑ රූපයට නැගී මෙනි.
- මේවා චිත්‍රාක්ෂර නමින් හැඳින්වේ.

## <u>ක්‍රියාකාරකම - 8</u>

**ඉහත තොරතුරු සහ පෙළ පොත 28 පිටුව උපයෝගී කරගෙන පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

1.



I. මෙම රූපයෙන් දැක්වෙන්නේ කිනම් රජුගේ රැජින ද?
II. ඇගේ නම ලියන්න.
II. ඔවුන් කිනම් රජ පෙළපතකට අයිති වේද?

2.



I. මෙහි දැක්වෙන අක්ෂර කිනම් කමකින් හැඳින්වේද?
II. මෙම අක්ෂර සඳහා සංකේත සකස්කර ඇත්තේ කිනම් දේවල් චිත්‍රයට නැගීමෙන් ද?

## <u>9 - පාඩම</u>

## <u>ඊජිප්තු ශිෂ්ටාචාර අවධිය - 2</u>



- මෙහි දැක්වෙන්නේ පක්ෂීන් හඹා යන ආකාරයයි.
- රාජකීයයන් මෙසේ පක්ෂීන් හඹා යයි.



- මෙම රූපයේ ප්‍රභූවරයෙකුගේ මමියක් දැක්වේ.
- මළ සිරුරු කල්තබා ගැනීමේ මමිකරණ ක්‍රමය ලෝකයට හඳුන්වා දුන්නේ ඊජිප්තු ශිෂ්ටාචාර වැසියන්ය.



- ක්‍රිස්තු පූර්ව 1332 – 1323 අතර කාලයේ ජීවත් වූ ටූටන්කාමන් රජුගේ මමියේ මුහුණ මත තබා තිබූ රනින් කළ වෙස් මුහුණ වේ.

## <u>ක්‍රියාකාරකම - 9</u>

පෙළ පොත සහ ඉහත තොරතුරු උපයෝගී කරගෙන පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1.



I. මෙම රූපයේ සිටින පුද්ගලයා කවුද?
II. මොහු කරනු ලබන කාර්යය කුමක්ද?

2.



I. මෙම රූපයෙන් දක්නට ලැබෙන්නේ කුමක් ද?
II. මළ සිරුරු කල් බතා ගැනීමේ ක්‍රමය හඳුන්වන නම කුමක් ද?
III. මෙම ක්‍රමය ලොවට හඳුන්වාදුන් ශිෂ්ටාචාරය කුමක්ද?

3.



I. මෙම වෙස් මුහුණ සාදා ඇත්තේ කිනම් ලෝහයකින් ද?
II. මෙය කිනම් රජ කෙනෙකුගේ මමියේ මුහුණ මත තබන ලද්දේ ද?

ඔබ ලෝකයේ පැරණි ශිෂ්ටාචාර යටතේ ඉගෙනගත් කරුණු සහ රූප සටහන් අධ්‍යයනය කර පහත දැක්වෙන ස්මාරක අයත් ශිෂ්ටාචාරය ලියා දක්වන්න.

| "අ" ස්මාරකය | "ආ" ශිෂ්ටාචාරය |
|---|---|
| සිගුරට් දේවාලය | |
| ශූන්‍ය අක්ෂර | |
| පිරමීඩ | |
| නෙෆනෙෆවුටෙන් නෙෆටීටි රැජින | |
| සත්ත්ව සංකේත සහිත මැටි මුද්‍රා | |
| ටූටන්කාමන් රජුගේ මුහුණේ රනින් කළ අනුරුව | |
| සෙල්ලම් මැටි කරත්තය | |